www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද, චීන ජනාධිපතිවරුන් කැලිෆෝර්නියාවේ දෙදින සාකච්ඡාවක

## US,Chinese presidents hold two-day discussions in California

**ජෝසෆ් සැන්ටොලන් විසිනි**
**2013 ජුනි 8**

දෙදින නිල නො වන සාකච්ඡාවල මුල් දිනය අරඹමින් එක්සත් ජනපද ජනාධිපති බරක් ඔබාමා හා චීන ජනාධිපති ක්ෂි ජින්පිං ජූනි 7 දා දකුනු කැලිෆෝර්නියාවේ දී හමුවූහ. එය ක්ෂි චීනයේ ජනාධිපති ලෙස පත්වූ මාර්තුවෙන් පසු නායකයන් දෙදෙනා අතර සිදුවූ ප්‍රථම හමුවීම යි.

මුලින් සැලසුම් කොට තිබුනේ ඔබාමා හා ක්ෂි අතර ප්‍රථම හමුව සැප්තැම්බරයේ දී සිදු කිරීමට ය. එක්සත් ජනපදය හා චීනය අතර සීග්‍රයෙන් උත්සන්න වන ආතතියත්, චීන සයිබර් යුද්ධය පිලිබඳ චෝදනාවන් හා උතුරු කොරියාව සමග බෙයිජිං පාලනය පවත්වන සම්බන්ධතාව ද පාවිච්චි කොට ක්ෂි මත පීඩනය යෙදවීමෙහිලා වොෂින්ටනයේ අභිප්‍රායත් නිසා ජූනි 7-8 සමුලුවට මග පාදා ඇත.

බෙයිජිං සමග ගැටුමකට එලැඹීමේ මාවතේ තමන් යන ගමන ආපසු හැරිය නොහෙන ලක්ෂ්‍යයකට ආසන්න වෙමින් පවතිතැයි යන්න පිලිබඳව එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්ති සම්පාදක ආයතනයන්හි කොටස්වල අවධානය පැහැදිලිව ම යොමු වී තිබේ. එක්සත් ජනපද හමුදා කඳවුරු පිහිටුවීමේ ගනුදෙනු, හමුදා අභ්‍යාස, බලය පෙන්වීම් සහ රාජ්‍ය තාන්ත්‍රික කූටෝපායන් හරහා චීනයේ ගෙල වටා ලූ තොන්ඩුව කල්යල් බලා තද කිරීමේ -"ආසියාවට හැරීම" ලෙස හඳුන්වනු ලබන- ඔබාමා පරිපාලනයේ වැඩපිලිවෙල විසින් සමස්ත ආසියා පැසිෆික් කලාපය ම කලාපීය ගැටුම්වලින් කැකෑරෙන කටාරමක් බවට හරවනු ලැබ ඇත.

පසුගිය 04 දා ආසියා සංසදයෙහි පෙනී සිටිමින් එක්සත් ජනපදයේ හිටපු රාජ්‍ය ලේකම් හෙන්රි කිසින්ජර්, ඔබාමා-ක්ෂි සමුලුව පිලිබඳව කතා කලේ මෙසේ යඃ"අප දැන් මුහුන දෙන තත්වය හමුවේ දෙරට හවුලේ විසඳා ගත යුතු පොදු ප්‍රශ්න රාශියක් පවතී. අප එසේ නො කලහොත්, මුලුමහත් ලෝකය ම, සෑම අංශයකින් ම, එක් මොඩලයක් හෝ අනෙක හා එක්වීමට බල කෙරුනු මිනිසුන් අතරේ බෙදී යනු ඇත. එවැන්නක් සිදු වුවහොත් එය අප දෙරටට හා ලෝකයට මහත් ව්‍යසනයක් වනු ඇත."

චීනය සමග වර්ධනය වන ආතතීන් ලිහිල් කිරීමට සූදානම් වීම වෙනුවට ඊට හාත්පසින් ම පටහැනි ලෙස, සමුලු සන්ධ්‍යාවේ ඔබාමා පැහැදිලිව ම ප්‍රදර්ශනය කලේ එක්සත් ජනපදයේ ආර්ථික හා මූලෝපායාත්මක පීඩනය තමන් විසින් තවදුරටත් දිගටම පවත්වා ගෙන යනු ඇති බව යි. බෙයිජිං පාලනය "(සියලු) ජාතීන් එකම නීති මාලාවක් යටතේ ක්‍රීඩා කරන ආර්ථික පර්යායකට" එකඟ විය යුතුයැයි ඔහු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කලේ ය. මේ කේතගත භාෂාවෙන් අදහස් කෙරෙන්නේ, එක්සත් ජනපදය තම උත්සුකයන්ට සරිලන පරිදි සිදු කෙරෙන ව්‍යවහාර මුදලේ හැසිරවීම් චීන නායකත්වය පිලිගත යුතු බව හා එක්සත් ජනපද සමාගම්වලට චීන ආර්ථිකය තවදුරටත් විවෘත කොට දිය යුතු බව යි.

ක්ෂි සමග පැවැත්වෙන සාකච්ඡාවල න්‍යාය පත්‍රයේ ප්‍රථම විෂයාංකය වන්නේ එක්සත් ජනපද හමුදාවන්හි මෙන්ම ඇමරිකානු සමාගම්වල ද පරිගනකවලට ක්‍රමානුකූලව අනවසරයෙන් ප්‍රවිෂ්ට වී දත්ත ලබා ගත් බවට චීන ආන්ඩුවට හා මහජන විමුක්ති හමුදාව (පීඑල්ඒ)ට එරෙහිව පෙන්ටගනය නගන චෝදනාව බව ඔබාමා පරිපාලනය පැහැදිලි ලෙසම පෙන්වා දී ඇත. සාකච්ඡාවලට මාස ගනනකට පෙර පටන් ධවල මන්දිරය මේ මාතෘකාව තෝරා ගෙන තිබුනේ, ප්‍රධාන පෙලේ ආර්ථික හා මූලෝපායික සහනයන් දිනා ගැනීමට බෙයිජිං පාලනය මත පීඩනය යෙදීමේ ව්‍යාජ හේතුවක් ලෙස ය.

චීන රජය විසින් කරන ලදැයි චෝදනා එල්ලවී ඇති, අනවසර පරිගනක ප්‍රවිෂ්ටය පිලිබඳ කිසිදු සාක්ෂියක් වොෂින්ටනය ඉදිරිපත් කොට නැත. කෙසේ වෙතත්, නම හෙලි නො කල ධවල මන්දිර නිලධාරියෙකු යුනයිටඩ් ඉන්ටර්නැෂනල් ප්‍රෙස් අමතා 04 දා පවසා ඇත්තේ, කොහොමටත් සයිබර් ප්‍රහාර පිලිබඳ අපවාදය ක්ෂි භාරගත යුතු යැයි ඔබාමා විසින් ඉල්ලා සිටිනු ඇති බව යි. මක්නිසාදයත්, "වගකිව යුත්තා කවුරුන් වුව ද, ස්වකීය දේශසීමා ඇතුලත සිට නිකුත් කරන දේ පිලිබඳ වගකීම රටවල් විසින් භාර ගත යුතු හෙයිනි."

චීනයට එරෙහිව ඔබාමා නගන සයිබර්-චරපුරුෂ කටයුතු පිලිබඳ චෝදනාවෙන් කුහකකමේ දුගඳ වහනය වෙයි. සයිබර්-චරපුරුෂ කටයුතුවලදී, අවර ගනයේ මෘදුකාංග යොදා කෙරෙන ඉලක්කගත ප්‍රහාරයන්ගේ හා අන්තර්ජාල ඔත්තු බැලීමේ (online surveillance) මධ්‍යස්ථානය වොෂින්ටනය මූලස්ථාන කොට පවතින්නකි. එක්සත් ජනපද බලධාරීහු තම අභිමතයට අනුව කටයුතු කිරීමට අසමත්වූ රටවලට එරෙහිව සයිබර් ප්‍රහාර එල්ල කිරීමට යලියලිත් ක්‍රියා කර ඇත්තාහ. ඉරානයේ න්‍යෂ්ටික බලාගාරවලට පහර දීමට ස්ටුනෙක්ස් පරිගනක කීට වයිරසය (computer worm) නිර්මානය කිරීම හා යෙදවීම සඳහා උදව් දීම ද මීට ඇතුලත් ය.

මීට වඩා දේවල් ද තිබේ. පසුගිය සතිවල දී හෙලිවූ පරිදි එක්සත් ජනපද ආන්ඩුව ඇසොෂියේටඩ් ප්‍රෙස් ආයතනයේ දුරකථනවලට රහසේ සවන් දී ඇති අතර, කෝටි සංඛ්‍යාත ඇමරිකානුවන්ගේ දුරකථන වාර්තා රැස් කිරීමට ද මයික්‍රොසොෆ්ට්, යාහූ, ගූගල්, ෆේස්බුක්, පැල්ටෝක්, ඒඕඑල්, ස්කයිප්, යූ ටියුබ් හා ඇපල් මධ්‍යසේවා (central server) පරිගනකවලට හොරෙන් සම්බන්ධවී ඒවා පරිහරනය කරන්නන්ගේ පෞද්ගලික තොරතුරු එක්රැස් කර ගැනීමට ද ක්‍රියා කොට ඇත. හෙලිවී ඇති මේ ප්‍රහාර ඉදිරියේ චීනයට එරෙහිව එක්සත් ජනපදය විසින් නගනු ලබන ඔප්පු නො කල සයිබර් අපරාධ චෝදනා හිරු දුටු කදෝපැනියන් සේ ප්‍රභාහීනව මලානික වෙයි.

ඔබාමා හා ක්ෂි අතර ප්‍රථම හමුව පැවැත්වුනු දිනයේ ම *ගාඩියන්* පුවත්පත, පසුගිය වසරේ ඔක්තෝබරයේ පැනැවුනු අතිශය රහසිගත ජනාධිපති ආඥාවක කාන්දුවක් පිලිබඳව වාර්තා කලේ ය. එමගින් ඔබාමා, "එක්සත් ජනපදය විසින් සයිබර් ප්‍රහාර එල්ල කිරීමට උචිත යැයි සැලකිය හැකි එතෙර ඉලක්ක" ලැයිස්තුගත කිරීමට ජ්‍යෙෂ්ඨ ජාතික ආරක්ෂක හා රහස් තොරතුරු අංශ නිලධාරීන් පිරිසකට පවරා ඇත.

මේ ප්‍රහාරයන්හි අරමුන වූයේ "ලොව පුරා එක්සත් ජනපදයේ ජාතික අභිප්‍රායන්" ඉහල නැංවීම යි. ආඥාවෙන් පැවසුනේ, "රාජ්‍ය ලේකම්, ජාතික රහස් තොරතුරු අධ්‍යක්ෂ හා සීඅයිඒ අධ්‍යක්ෂ...එක්සත් ජනපදය විසින් ප්‍රහාරක සයිබර් කාර්ය මෙහෙයුම් හැකියාවන් ගොඩ නගා පවත්වා ගෙන යාමේ දී, ඉලක්ක බවට පත් වීමේ විභවයකින් යුතු පද්ධති, ක්‍රියාවලීන් හා උපරිව්‍යුහයන් හඳුනාගැනීමේ සැලැස්මක් පිලියෙල කොට ජනාධිපතිගේ අනුමැතිය සඳහා ජාතික ආරක්ෂක උපදේශකවරයා හරහා ඉදිරිපත් කල යුතු" බව යි.

මේවා විදේශයන්ට එරෙහිව එල්ල කෙරෙන පූර්ව භංග ප්‍රහාර විය යුතුව තිබිනි. "හදිසි" අවස්ථාවක දී හැර, රට තුල සයිබර් ප්‍රහාරයක් දියත් කිරීමට ජනාධිපති අනුමැතිය අවශ්‍ය වනු ඇත.

ඔබාමා ක්ෂි වෙත පීඩනය යෙදීමට යත්න දරන තවත් පෙරමුනක් වනුයේ, උතුරු කොරියාව සමග චීනය පවත්වන සම්බන්ධතාවන් ය. සිය "ආසියාවට හැරීමේ" වැඩපිලිවෙල තීව්‍ර කිරීම සඳහා ව්‍යාජ හේතු තනා ගැනීමට වොෂින්ටනය සැම විටම රැඳී සිටින්නේ, උතුරු කොරියාවෙන් නොවැරදීම පලවෙතැයි අපේක්ෂා කෙරෙන පූච්චානම් ගර්ජනා මත ය.

මාස ගනනකට ඉහත දී සකස් කෙරුනු "නාට්‍ය පිටපතක්" අනුයමින් වොෂින්ටනය මාර්තුවේ දී න්‍යෂ්ටික හැකියාවන් සහිත බී-52 හා බී-2 බෝම්බ ප්‍රහාරක යානා උපයෝගී කොට ගෙන බෝම්බ හෙලීමේ පුහුනු අභ්‍යාස පැවැත්වීම මගින්, ප්යොංයැංහි හා බෙයිජිංහි ආන්ඩු දෙක ම හිතාමතා ම ප්‍රකෝප කලේ ය. උතුරු කොරියාව මිසයිලයක් මුදා හැරීමට තර්ජනය කරමින් ඊට ප්‍රතිචාර දැක්වූ විට, එය අල්ලා ගත් වොෂින්ටනය, කලාපය තුල සිය හමුදා බලය වැඩි කිරීමට, සිය බැලස්ටික් මිසයිල නාශක නිවාරක පද්ධතිය ප්‍රසාරනය කිරීමට සහ ප්යොංයැං පාලනය සමග ආර්ථික හා දේශපාලන සබඳතා බිඳ දමන ලෙස බෙයිජිං පාලනයට බල කිරීමට එය ගසා කෑවේ ය. කලාපයේ එක්සත් ජනපද අනුචරයෙකු වන දකුනු කොරියාව හා තමන් අතර බෆර් රාජ්‍යක් (buffer state) ලෙස චීනය, දීර්ඝ කාලයක සිට උතුරු කොරියාව මත රැඳී සිටියි.

උතුරු කොරියානු රජයේ චපල කයිවාරු ගැසීම්, පෙරදිග ආසියාව තුල සිය හමුදා බලය වැඩි කිරීම සඳහා ව්‍යාජ හේතුවක් ලෙස වොෂින්ටනය විසින් අල්ලා ගනු ලැබීමත් සමග, බෙයිජිං නායකත්වයේ ඇතැම් කොටස් ප්යොංයැං පාලනයෙන් දුරස්ථවීමට ක්‍රියා කර ඇත. උතුරු කොරියාවේ විශාලතම විදේශ විනිමය බැංකුව සමග පැවැති මූල්‍ය සම්බන්ධතා කපා හැරීමට ක්‍රියා කල ඔවුහු, කිම් ජොං උන් ඉවත් කොට අනෙකෙකු පත් කිරීම සඳහා ශක්‍යතා සැලැස්මක් ජර්මන් මාධ්‍යයට කාන්දු කලෝ ය.

වොෂින්ටනයෙන් නැගෙන පීඩනයට බෙයිජිං පාලනය දන නමනු ඇතැයි බියපත් වූ ප්යොංයැං පාලකයෝ, පසුගිය 06 දා, දකුනු කොරියාව හා සාකච්ඡා යලි ආරම්භ කිරීමට ද, මාර්තුවේ සාකච්ඡාවලින් ඉවත්වීමේ දී වසා දමන ලද සෘජු හදිසි ඇමතුම් සම්බන්ධතා යලිත් විවෘත කිරීමට ද සියොල් පාලනය සමග කටයුතු සූදානම් කලහ.

කැලිෆෝර්නියා සමුලුවේ දී චීනය මත මිලිටරි පීඩනය යෙදීමේ අවස්ථාවක් උදා කර ගැනීමට ඔබාමා පාලනය අමතක කොට නැත. බීජිං ආන්ඩුවට එරෙහිව ගනන් බලා කෙරෙන තර්ජනයක් ලෙස, ක්ෂි සමග සමුලුවෙන් දින හතරකට පසු දකුනු කැලිෆෝර්නියාවේ දී ජපානය හා ඒකාබද්ධ හමුදා අභ්‍යාස පැවැත්වීමට පෙන්ටගනය කටයුතු යොදා ඇත. ජීව උන්ඩ භාවිත කරමින් පැවැත්වෙන වෙඩි තැබීමේ යුද සරඹ හා භූගත බෝම්බ මෙහෙයුම් ද සහිත මෙම අභ්‍යාසයන්ට, සැන් ක්ලෙමන්ට් දූපත ඉලක්ක කොට දිය ගොඩ දෙකෙන් ම එල්ල කෙරෙන ප්‍රහාර මාලාවක් ද ඇතුලත් වේ. සැන් ක්ලෙමන්ට් දූපත මේ කාර්යය සඳහා තෝරා ගෙන ඇත්තේ, එය ජපානය හා චීනය අතර දිගු කලෙක සිට පවතින නාවුක හා රාජ්‍ය තාන්ත්‍රික ආරාවුලකට හේතුභූත වී ඇති සෙන්කකු/දියෝයු දූපත්වලට සමානකම් දක්වන නිසා ය.

චීන රජය මෙම අභ්‍යාස අත් හැර දමන ලෙස වොෂින්ටනයෙන් ඉල්ලා ඇතත්, ඔබාමා පාලනය එම ඉල්ලීම නිශ්චිතව ම ප්‍රතික්ෂේප කොට ඇත. එම තීරනයෙන් පිලිබිඹු වන්නේ චීනය සමග දේශසීමා ආරාවුල් අවුලා ගැනීමට ජපානය හා අනෙකුත් රාජ්‍යයන් දිරි ගන්වමින් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය කලාපය තුල රඟ දක්වනු ලබන අතිශය ප්‍රකෝපකාරී භූමිකාව යි.

© www.wsws.org